සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ගිහියාගේ නිත්‍ය ශීලය මෙන්ම ගෘහස්ථ ශීලය ලෙස ද හඳුන්වනු ලබන්නේ,

1. ආජීව අෂ්ටමක ශීලයයි.
2. පංච ශීලයයි.
3. අෂ්ඨාංග ශීලයයි.
4. ගිහි දස ශීලයයි.

(02) බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ හෙයින් ද, සියලු කෙලෙස් නැසූ හෙයින්ද සියලු පූජාවන් ලැබීමට සුදුසු හෙයින් ද,

1. අරහං වන සේක.
2. සම්මා සම්බුද්ධ වන සේක.
3. සුගත වන සේක.
4. ලෝකවිදූ වන සේක.

(03) " මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි" යන්නෙහි නිවැරදි අදහස වන්නේ,

1. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යන්නයි.
2. ජීවිත විනාශ කිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදම් වෙමි යන්නයි.
3. සුරාපානය කිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදම් වෙමි යන්නයි.
4. බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදම් වෙමි යන්නයි.

(04) ''පිසුණාවාචා වේරමණී " යන්නෙහි තේරුම වන්නේ,

1. සතුන් මැරීමෙන් වැළකීම යන්නයි.
2. බොරු කීමෙන් වැළකීම යන්නයි.
3. කේළාම් කීමෙන් වැළකීම යන්නයි.
4. හිස්වචන කීමෙන් වැළකීම යන්නයි.

(05) සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන පරිදි ගෞරව දැක්වීමට සුදුසු පුද්ගලයන් අතර ගුරුවරුන් උපමා කොට ඇත්තේ,

1. දකුණු දිශාවට ය.
2. උතුරු දිශාවට ය.
3. උඩ දිශාවට ය
4. නැගෙනහිර දිශාවට ය.

(06) කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් වන පරිදි මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග ගණනින්,

1. දහයකි.
2. පහළොවකි.
3. විස්සකි.
4. තිහකි.

(07) ''ඒ ශ්‍රමණ භවත් ගෞතමයෝ තමන් හමුවට එන අය ප්‍රිය වචනයෙන් පිළිගත්තෝ ය." යන ප්‍රකාශයෙන් බුදුරජාණන් වහන්සේව අගය කිරීමට ලක් කළේ,

1. සෝණදණ්ඩ බමුණා විසිනි.
2. ගෝදත්ත තෙරුන් වහන්සේ විසිනි.
3. පුණ්ණ තෙරුන් වහන්සේ විසිනි.
4. බ්‍රහ්මදත්ත නම් රජෙකු විසිනි.

(08) බුදු රජාණන් වහන්සේ තුළ පැවති ඉවසීමේ ගුණය ප්‍රකට වන අවස්ථාවකට උදාහරණයක් **නොවන්නේ,**

1. චිංචි මාණවිකාවගේ සිද්ධිය යි.
2. සුන්දරී පරිබ්‍රාජිකාවගේ සිද්ධිය යි.
3. කළාබු නම් රජුගේ සිද්ධිය යි.
4. මාගන්දි නම් බැමිණියගේ සිද්ධිය යි.

(09) දස පුණ්‍ය ක්‍රියාවන්හි වෘද්ධාපචායනය ලෙස හඳුන්වන්නේ,

1. අසරණයින්ට පිහිටවීම යි.
2. අන්‍යන්ට උපකාර කිරීම යි.
3. වැඩිහිටියන්ට සැළකීම යි.
4. භික්ෂූන්වහන්සේලාට ගරු සැලකිලි දැක්වීම යි.

(10) අස්වැන්න නිවසට ගෙන ඒමත් සමග නිවසේ පැවැත්වෙන චාරිත්‍ර අතර මුළින්ම සිදු කෙරෙන කාර්ය වන්නේ,

1. දේවාලයට ගෙනයාම සඳහා අක්කියාල වෙන් කිරීම යි.
2. බුදුරුවනට හා සඟරුවනට දන් පූජා කිරීමයි.
3. කිරිඅම්මා වරුන්ට දානය පිරිනැමීම යි.
4. වැඩිහිටි නෑයන්ට ආහාරයෙන් සංග්‍රහ කිරීම ය.

(11) වැඩිහිටියන්ට නිසි සැලකිලි දැක්විය යුතු ආකාරය අපට පහදා දෙන උපදේශ ඇතුළත් බෞද්ධ කතා පුවතක් **නොවන්නේ,**

1. අපණ්ණක ජාතකය යි.
2. තිත්තිර ජාතකය යි.
3. සාම ජාතකය යි.
4. සාලිකේදාර ජාතකය යි.

(12) "ගුරුසිත නොරිදවා - වේලාව නොවරදවා
බැතිපෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා"

මෙම පද්‍ය පන්තිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය වන්නේ,

1. ගුත්තිල කාව්‍යය
2. කාව්‍යශේකරය.
3. ලෝවැඩ සඟරාව.
4. බුදුගුණ අලංකාරය.

(13) "පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු" යන කවියහි සඳහන් පරිදි පින් අඩු දරුවන් ලෙස හඳුන්වන්නේ,

1. සාධන මට්ටම අඩු දරුවන් ය.
2. ගුණ නුවණ නැති දරුවන් ය.
3. ක්‍රිඩාශීලී දරුවන් ය.
4. යහළු ඇසුර වැඩි දරුවන්ය.

(14) තමා වරදින් මිදීම, අන්අය ලවා වැරදි නොකිරීම, වරදට අනුබල නොදීම අයත් වන්නේ,

1. අත්තාධිපති ශීලයයි.
2. ධම්මාධිපති ශීලයයි.
3. ලෝකාධිපති ශීලයයි.
4. ත්‍රිකෝටිපාරිශුද්ධ ශීලයයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(15) වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී හැසිරීමෙන් හොඳම ශිෂ්‍යා තෝරා ගැනීමට යොදා ගත් නිර්ණායක අතරින් **නොගැළපෙන** නිර්ණායකය වන්නේ,

1. තමන්ගේ යහළුවන් සමග පමණක් සහයෝගයෙන් කටයුතු කිරීම යන්නයි.
2. සමානාත්මකතාව අගය කරන අයෙකු වීම යන්නයි.
3. අවිහිංසාවාදීව කටයුතු කිරීම යන්නයි.
4. අනතිමානීව කටයුතු කිරීම යන්නයි.

(16) පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන පරිදි පඤ්ච බලිවලට අයත් "අථිති බලි" යනුවෙන් හඳුන්වන්නේ,

1. රජුන් සඳහා ධනය වැය කළ යුතු බවයි..
2. ආගන්තුකයින් සඳහා සංග්‍රහ කළ යුතු බවයි.
3. ඥාතීන් සඳහා සංග්‍රහ කළ යුතු බවයි..
4. දේවතාවුන් සඳහා ධනය වැය කළ යුතු බවයි.

(17) ශිෂ්‍යයකු වශයෙන් ඔබගේ ගුරුවන්ගේ සිත් සතුටු කිරීම වෙනුවෙන් ඔබට කළ හැකි ඉහළම යුතුකම වන්නේ,

1. හොඳින් ඉගෙන ගැනීමයි.
2. අවශ්‍ය කටයුතු සිදු කර දීමයි.
3. ගුරුතුමාට සියලු ඇප උපස්ථාන සිදු කිරීමය.
4. ගුරුතුමා දුටු විට හුනස්නෙන් නැගී සිටීමය.

(18) හොඳ නරක තෝරාබේරා ගත් සමාජයක් තුළ නිවැරදි දිවි පැවැත්මක් ඇතිව ජීවත්වීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත වන්නේ,

1. සාරධර්ම ආරක්ෂා කිරීම ය.
2. ජාතීන් අනුව වෙන්වීමයි.
3. බොහෝ ධනය රැස්කිරීමයි.
4. කර්මාන්ත වැඩි කිරීමයි.

(19) වර්තමානයේ හොඳ දරුවෙකු ලෙස ඔබට කළගුණ සැලකීම ප්‍රගුණ කළ හැකි අවස්ථාවකට උදාහරණයක් වන්නේ,

1. තමාට නිතර උදව් වන මිතුරෙකු අසනීප වූ අවස්ථාවක ඔහුව නොසලකා හැරීම ය.
2. පොතක් බිමට වැටුණු පසුත් පාඩම් කර අවසන් වූ පසුත් ඒවාට වැඳ මේසය මත තැබීම ය.
3. තමාගේ යහළුවෙකු උදව්වක් ඉල්ලූ විට ඒ ගැන සැලකිල්ලක් නොදැක්වීම යි.
4. තමාගේ මිතුරෙකුට ආහාර නැති අවස්ථාවක දී තමා තනිව ආහාර ගැනීම ය.

(20) මත් වතුර හා මත් ද්‍රව්‍ය භාවිත කිරීම තුළින් පුද්ගලයාට ශාරීරිකව සිදුවන අයහපත් ප්‍රතිඵලයක් වන්නේ,

1. රෝගවලට ලක්වීමයි.
2. සමාජයේ අපකීර්තියට පත් වීමයි.
3. තමා සතු ධන සම්පත් අහිමි වීමයි.
4. ලැජ්ජා භය ඇති වීමයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස - 7 ශ්‍රේණිය

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(01) ඔබ පන්ති කාමරයේ දී දෙවන වාරයේ 12 පාඩම ඇසුරෙන් සිදුකළ පාසල් පාදක තක්සේරුකරණයට අදාළව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. භූමිකා රංගනයේ පිටපතට යෙදූ මාතෘකාව නම් කරන්න. (ලකුණු 2)
2. එම පිටපතට අදාළව ඔබ යොදාගත් චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 2)
3. භූමිකා රංගනය සඳහා ඔබේ ගුරුතුමාගෙන් ලැබුණු උපදෙස් 02 ක් ලියන්න. (ලකුණු 2)
4. බුදු රජාණන් වහන්සේ ඉවසීමේ ගුණය පිළිබඳව සාකච්ඡා කළ සුනාපරන්තවාසී ස්වාමීන් වහන්සේ කවුරුන් ද? (ලකුණු 2)
5. දස පාරමිතාවට අයත් "සවැනි පාරමිතාව" නම් කරන්න. (ලකුණු 2)
6. "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය" මෙහි ඉතිරි කවි පදය සම්පූර්ණ කරන්න. (ලකුණු 2)
7. ඉවසීමෙන් ලැබෙන ආනිසංස 04 ක් ලියන්න. (ලකුණු 4)
8. වර්තමානයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් පළ කරන ලද පුවත් පත්වලට අනුව වස බීම, පහර දීම, ගෙල වැළලා ගැනීම වැනි සිද්ධීන් බහුලව අසන්නට හා දකින්නට ලැබේ. මෙවැනි පාපී ක්‍රියාවලින් වෙන් වීමට අප තුළ ඇති කර ගත යුතු ගුණාංග 04 ක් ලියන්න. (ලකුණු 4)

( 02)
1. ප්‍රාණඝාත අකුසල කර්මය අයත් වන, පස්පව්වල සඳහන් සිල්පදය නම් කරන්න. (ලකුණු 2)
2. පුද්ගලයන් පන්සිල් සුරැකීමේ දී යොමු විය යුතු අංශ 03 ලියන්න. (ලකුණු 3)
3. අප සියලු දෙනා පන්සිල් සුරකින විට පෞද්ගලිකවත් සමාජීය වශයෙන් ලැබෙන ආනිසංස පිළිබඳව විස්තරයක් කරන්න (ලකුණු 5)

(03)
1. බුදු රජාණන් වහන්සේ යුතුකම් හා අයිතිවාසිකම් දක්වමින් දේශනා කරන ලද සූත්‍රය දේශනා කළේ කා හට ද? (ලකුණු 2)
2. ගුරුවරුන් විසින් සිසුන්ට ඉටු කළ යුතු යුතුකම් 03 ක් ලියන්න. (ලකුණු 3)
3. පාසල් ශිෂ්‍යයින් වන ඔබට මනා ගුරු සිසු සබඳතාව ගොඩනගා ගැනීමෙන් ඇතිවන ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 5)

(04)
1. චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය යනු කුමක් ද? (ලකුණු 2)
2. "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ" යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 3)
3. ආදර්ශවත් සිසුවෙකු වීමට පාසැලේ දී ඔබ අනුගමනය කළ යුතු සිරිත් පහක් ලියන්න. (ලකුණු 5)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(05) 1. බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

2. ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 3)

3. පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට, අසරණයන්ට පිහිටවිය හැකි අවස්ථා පහක් ලියන්න.

(ලකුණු 5)

(06) 1. "අග්‍රශෂ්‍ය දානය" යනු කුමක් ද? (ලකුණු 2)

2. බෞද්ධයන්ගේ උපතේ සිට මරණය දක්වා සිදුවන විශේෂ සිදුවීම් 03 ක් ලියන්න.

(ලකුණු 3)

3. "බෞද්ධයන් ආගන්තුක සත්කාරය ඉහළින් සිදුකරයි." මේ පිළිබඳ අදහස් දක්වන්න.
(ලකුණු 5)

(07) 1. බෞද්ධයාගේ අත්පොත ලෙස සලකන ධම්මපද ග්‍රන්ථය අයත් පිටකය හා නිකාය නම් කරන්න. (ලකුණු 2)

2. "අසවලා මට බැන්නේය, මට පහර දුන්නේය, මා පරාජය කළේය, මා සතු දෙය පැහැර ගත්තේය යනුවෙන් නැවත නැවත සිතයි නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ" යන අදහස ඇතුළත් ධම්ම පද ගාථාව ලියන්න. (ලකුණු 3)

3. පාසල් ශිෂ්‍යයන් වන ඔබට, සමාජයේ ජීවත් වීමේදී වෛර නොකිරීමෙන්, ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 5)